# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2001/38 - 2017 ජනවාරි මස 13 වැනි සිකුරාදා - 2017.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : ව/18/84/2011.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/4/2011/ඩී/142.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම්පත්තුව සුළු කොට්ඨාසයේ, 179 ඇලපිටිවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නවම්මහර ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ගම්. 3996 හා 2016.12.02 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01-05 දක්වා පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 3.9135 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කැබලි.

1. **කැබලි අංක 1**
ඉඩමේ නම: —; විස්තරය: ඇළ; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.6165

2. **කැබලි අංක 2**
ඉඩමේ නම: — ; විස්තරය: ඇළ; හිමිකම් කියන අය: ෂර්මන් පුත්‍ර සමාගම, අංක 194 ජී, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2849

3. **කැබලි අංක 3**
ඉඩමේ නම: කුරුඳුවත්ත ; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: ෂර්මන් පුත්‍ර සමාගම, අංක 194 ජී, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05; ප්‍රමාණය: හෙක්ටයාර් 2.9231

4. **කැබලි අංක 4**
ඉඩමේ නම: — ; විස්තරය: ඇළ; හිමිකම් කියන අය: ෂර්මන් පුත්‍ර සමාගම, අංක 194 ජී, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0801

5. **කැබලි අංක 5**
ඉඩමේ නම: — ; විස්තරය: පාර; හිමිකම් කියන අය: ෂර්මන් පුත්‍ර සමාගම, අංක 194 ජී, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0089

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 මාර්තු මස 08 වැනි දින පෙ. ව. 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 මාර්තු මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩබ්ලිව්. ජී. ප්‍රේමලාල්,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2017 ජනවාරි මස 09 වැනි දින.
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

01 - 935

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24923 - 13 - (2017/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.